// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2072/45 – 2018 මැයි මස 24 වැනි බ්‍රහස්පතින්දා – 2018.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක: IR/10/37/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.06.08 දිනැති හා අංක 1761/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.05.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් ධර්ගා නගරය, වරාපිටිය, උඩුම්බුගොඩ, නො. 128 බී හි පදිංචි ඩබ්ලිව්.පී.ටී. රෝහණ සිල්වා මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 03, ගාලු පාර, අංක 676හි පිහිටි කලම්බු කොමියුනිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් (ඊ.ඒ.පී. බ්‍රෝඩ්කාස්ටින් කම්පැනි ලිමිටඩ්) අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.02.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ.විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 මැයි මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05 දී ය.

යොමු අංකය : IR/10/37/2011

කාර්මික අධිකරණයේ දී ය,

ඩබ්ලිව්.පී.ටී. රෝහණ සිල්වා මයා,
නො. 128 බී,
උඩුම්බුගොඩ,
වරාපිටිය,
ධර්ගා නගරය.

පළමු පාර්ශවය

නඩු අංකය : A 3449

සහ

කලම්බු කොමියුනිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(ඊ.ඒ.පී. බ්‍රෝඩ්කාස්ටින් කම්පැනි ලිමිටඩ්)
නො. 676, ගාලු පාර, කොළඹ 03.

දෙවන පාර්ශවය

අතර පවතින කාර්මික ආරාවුල,

*ප්‍රදානය*

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2012.05.10 වැනි දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

*ආරාවුලට තුඩුදුන් කාරණය*

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කලම්බු කොමියුනිකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්හි රියදුරෙකු ලෙස සේවය කළ ඩබ්ලිව්.පී.ටී. රෝහණ සිල්වා මහතාට 2002.08.15 දින සිට 2002.12.31 දින දක්වා සහ 2004.01.01 දින සිට 2004.09.25 දින දක්වා සේවය කළ කාලය තුළ හිමිවිය යුතු අතිකාල සේවා දීමනාව (රු. 1,34,625/- ක මුදලක්) නොගෙවීම යුක්ති සහගත ද යන්න සහ එසේ නොවන්නේ නම් ඔහුට හිමි විය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

*පසුබිම*

ඉල්ලුම්කරු වගඋත්තරකාර ආයතනයේ රියදුරෙකු ලෙස සේවයේ යෙදී සිටියදී සෙවනගල ප්‍රදේශයේ රාජකාරි කටයුත්තක් ඉටු කර නැවත පැමිණි අවස්ථාවේදී පසුදින සේවයට පැමිණෙන ලෙස කරන ලද ඉල්ලීම විධාවට පත් වූ නිසා කළ නොහැකි බව දන්වා සිටිය ද කෙසේ හෝ පැමිණෙන ලෙස වගඋත්තරකාර ආයතනයේ දැනුම් දුන්නද එසේ සේවයට පැමිණීමට නොහැකි වී පසු දින සේවයට පැමිණි අවස්ථාවේ ආරක්ෂක නිලධාරීන් සේවා ස්ථානයට පැමිණීමට ඉඩ නොදී ඇත. ඉල්ලුම්කරු නිවසට යන අවස්ථාවේ හදිසි අනතුරකට මුහුණ පෑමෙන් මාස 04ක් පමණ සේවයට වාර්තා කිරීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධයෙන් කළමණාකාරිත්වයට දන්වා අතිකාල මුදල් ඉල්ලා සිටියද එසේ නොහැකි බව දන්වන ලදී.

මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින් ම ප්‍රකාශ ඉදිරිපත් කරන ලදී. විශේෂයෙන් වගඋත්තරකාර පක්ෂය ලිඛිත දේශන මගින් නඩුව පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් විරෝධතා ගොනු කරන ලදී. විරෝධතා සම්බන්ධයෙන් වර්ෂ 2013.10.28 දින නියෝගය ප්‍රකාශයට පත් කරන ලදුව ඒ අනුව විරෝධතාවය ප්‍රතික්ෂේප කරමින් ආරාවුල විසඳීමට බේරුම්කරණයට අධිකරණ බලය ඇති බව ප්‍රකාශ කරන ලදී.

වර්ෂ 2014.01.13 වන දින ඉල්ලුම්කරු පෞද්ගලිකව පෙනී සිටිමින් 2002.08.10 වන දින සිට 2004 සැප්තැම්බර් මාසය දක්වා වැඩ කළ බවත් සේවා කාලයේදී අතිරේක වැඩ සඳහා අතිකාල දීමනා නොගෙවූ බවත් සඳහන් කරන ලදී. අතිකාල දීමනා ලබා ගැනීම සඳහා 2005 දෙසැම්බර් මස සිට පනස් අට වතාවක් පැමිණ ඇති බව අවධාරණය කරන ලදී.

ඉල්ලුම්කරු සෙවනගල ප්‍රමෝෂන් එකකට නිලධාරීන් දෙදෙනෙක් සමඟ ගිය බවත් අසනීප ගතිය නිසා පසු දින සේවයට නොපැමිණෙන බවට දැන්වූවද ප්‍රවාහන කළමණාකරීතුමා ආරක්ෂක අංශයට ඉල්ලුම්කරුට ඇතුළුවීමට ඉඩනොදෙන බව දන්වන ලදී. 2014.03.20 වන දින ඉල්ලම්කරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නියමිතව තිබුණද වගඋත්තරකරුවන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොඅසන ලද බවත් වග උත්තරකරුවන් වෙනුවෙන් සාක්ෂි නොකැඳවන බවත් දන්වන ලදී.

කෙසේ වෙතත් 2014.04.24 වන දින වගඋත්තරකරුවන් වෙනුවෙන් පිටු හතරකින් සහ ඡේද 11න් සමන්විත ලිඛිත දේශනයක් ගොනු කරන ලදී. විශේෂයෙන් ම වගඋත්තරකරුවන් වෙනුවෙන් හරස් ප්‍රශ්න නොඇසූ බවත් සාක්ෂි නොකැඳ වූ බවත් සලකා බැලීමේදී ලිඛිත දේශන කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.

වගඋත්තරකරු විසින් තම ලිඛිත දේශනයේදී 3 සහ 4 සහ 5 යන ඡේදයන්හීදී දක්වා ඇත්තේ ඉල්ලුම්කරු අවුරුදු 2යි මාස 2ක අතිකාල මුදල ලෙස එක් ලක්ෂ තිස් හතර දහස් හයසිය විසි පහ (රු. 1,34,625/-)ක මුදලක් ගෙවිය යුතු බවට සඳහන් කර ඇතත් එය පැහැදිලි කර

නැති බවයි. මීට පෙර එනම්, වර්ෂ 2013ක් වූ ජනවාරි මස 09 වන දින ඉදිරිපත් කරන ලද මූලික විරෝධතාවයට අදාළ ලිඛිත දේශනයේදී තුන්වන ඡේදයේ පැහැදිලිවම $X_2$ ලෙස ලේඛනයක් ලකුණු කර ඇත. එම ලේඛනය මූලික පිළිගැනීමක් ලෙස සැලකුවහොත් එම අවස්ථාවේදී ලේඛනයේ අඩුපාඩු සහ දොෂ නොපෙන්වා වගඋත්තරකරු, විසින්ම එකී ලේඛනය ලකුණු කර නඩුව අවසානයේදී එකී ලේඛනයට අදාල මුදල් පිළිබඳ අභියෝග කිරීම කළ නොහැක්කකි. ඒ අනුව වගඋත්තරකරු මෙම විමසීමේදී හරස් ප්‍රශ්න නොඇසීමත් වගඋත්තරකරු වෙනුවෙන් සාක්ෂි ඉදිරිපත් නොකිරීමත් සලකා බැලීමේදී ඉල්ලුම්කරුගේ ඉල්ලීම සාධාරණ හා යුක්ති සහගත බව නිගමනය කරමි.

*ප්‍රදානය*

1. එසේහෙයින් ඉල්ලුම්කරුට ඔහුගේ ඉල්ලීම අනුව හිඟ අතිකාල මුදල වූ එක්ලක්ෂ තිස් හතර දහස් හයසිය විසිපහ (රු. 1,34,625/) ක මුදල ගෙවන ලෙස නියෝග කරමි.
2. තවද ඉල්ලුම්කරුට නඩු ගාස්තු වශයෙන් වගඋත්තරකරු විසින් රුපියල් හැත්තෑපන් දහස (රු. 75,000/-)ක මුදලක් ද ගෙවිය යුතු බවට නියෝග කරමි.
3. මෙකී ප්‍රදානයන් ගැසට් පත්‍රයේ පළ වූ දින සිට මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතුය. මුදල් නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

*සටහන*

මෙම බේරුම්කරණ විභාගයට සෑහෙන කාලයක් ගත වූයේ දෙපාර්ශවයම වරින් වර දින ඉල්ලා කරන ලද ඉල්ලීම්වල ප්‍රතිඵලයක් හැටියටය. විශේෂයෙන්ම මෙම ප්‍රදානය සකස් කොට ඉදිරිපත් කිරීම ප්‍රමාද වූයේ නොවැළැක්විය හැකි අති පෞද්ගලික හේතූන් නිසා බවත් ඒ සම්බන්ධයෙන් දෙපාර්ශවයටම කිසියම් අපහසුතාවයක් වූයේ නම් ඒ සම්බන්ධයෙන් පෞද්ගලිකව අතිශයින්ම කණගාටුවට පත්වෙමි.

එස්.එම්.එස්. ජයවර්ධන,
බේරුම්කරු.

2018 පෙබරවාරි මස 28 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

06-473

---

මගේ අංකය: IR/22/82/2009.

**කාර්මික ආරාවුල් පනත, 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.02.07 දිනැති හා අංක 2005/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.12.05 දින දරණ නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන්, ඇඹෝගම, නබඩෑව, "සමාධි" හි පදිංචි ආර්.ඩී. සිරිසේන මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.02.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ.විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 මැයි මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ දී ය.

මගේ අංකය: IER/22/82/2009.

කාර්මික අධිකරණයේ දී ය,

ආර්.ඩී. සිරිසේන මයා,
"සමාධි", ඇඹෝගම,
නබඩෑව.

ඉල්ලුම්කරු

එරෙහිව

නඩු අංකය : A/11/2017

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

වගඋත්තරකරු,

යන දෙපාර්ශවය අතර පැවති කාර්මික ආරවුල.

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මහතා වෙත පැවති ඇති බලතල අනුව වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2016.12.05 වැනි දිනැති නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත්කොට ඇත.

***ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පැවති කරුණ වූයේ :***

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිකවැරටිය ඩිපෝවේ කොන්දොස්තරවරයකු ලෙස සේවය කළ ආර්.ඩී. සිරිසේන මහතාට වයඹ ජෝ.විනි-2/නික/2008-207 අංක හා 2008.06.30 දිනැති ලිපිය මගින් ලබාදුන් විනය නියෝගය අනුව 2008.03.01 සිට 2008.07.01 දින දක්වා නොගෙවන ලද අර්ධ වේතනය හා 2014.05.01 සිට 2014.06.01 දින දක්වා වැඩ තහනම් කළ මාසයක කාලයට හිමි වැටුප ගෙවන ලෙසට ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත වන්නේද යන්න හා එලෙස යුක්ති සහගත වන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද?" යන්න පිළිබඳ වේ.

දෙපාර්ශවය විසින් ඔවුන්ගේ ප්‍රකාශ හුවමාරු කර ගැනීමෙන් පසු 2017.09.04 දින ඉල්ලුම්කරු වෙනුවෙන් පී.එච්. තිලකසිරි මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර ආයතනයේ නීති නිලධාරිනි නදීෂා අමරතුංග මහත්මියගේ උපදෙස් මත නීතිඥ සජිත් බණ්ඩාර මහතා පෙනී සිටියදී ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි අවසන් කර වගඋත්තරකාර පාර්ශවය හරස් ප්‍රශ්න අසා ඉල්ලුම්කරුගෙන් නැවත ප්‍රශ්න ඇසීමෙන් පසු ඉල්ලුම්කරු සමථ යෝජනාවක් වග උත්තරකාර පාර්ශවයට ඉදිරිපත් කරන ලදී.

එකී සමථ යෝජනා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව 2018.01.04 වන දින රු. 49,417.38 ක මුදලක් මහජන බැංකුවේ අංක 316336 දරණ 2018.01.04 දිනැති චෙක්පත මගින් ගෙවීම් කර නඩුව සමථයකට පත්විය.

ඒ අනුව ඉහත දෙපාර්ශවයේ කැමැත්ත පරිදි මෙම නඩුව මෙයින් අවසන් කරමි.

**ආර්.එස්.ආරියප්පෙරුම,**
බේරුම්කරු.

2018 පෙබරවාරි මස 28 වැනි දින.

06 - 474

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.